පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290
ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිම.

பாராளுமன்ற வெளியீடு வரிசை எண் : 290
நிறுவனத்தின் பெயர்: மாவட்ட செயலகம், களுத்துறை

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை 119(4) இன் கீழ் கௌரவ நிறுவனங்களுக்குப் பொறுப்பான அமைச்சரினால் மேற்கொள்ளப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary series No : 290**
**Name of the Institution: District secretariat, Kalutara**

**Submission of observations of the Hon Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of standing Order 119(4).**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබද කාරක සභාව විසින් සභාගත කරන කරන ලද ස්ථාවර නියෝග **119(4)** සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

---

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 290

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර

පළමු කොටස : 71.00

| | රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මග පෙන්වීම. | ගණන් දීමේ නිළධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | හානි පිළිබද ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත | යාවත්කාලීන කරන ලෙස විෂයභාර නිලධාරී දැනුවත් කිරීම | යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. |
| 02 | බැරකම් පිළිබද ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත | බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර ඇත. |
| 03 | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම. | විෂයභාර නිලධාරී දැනුවත් කර ඇත. | යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. |
| 04 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි | නිවැරදි දිනයට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදීම. | දිස්ත්‍රික්කයට අදාලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. |
| 05 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | සකස් කර ඇත. |
| 06 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි | ප්‍රදේශීය ලේකම් කාර්යාල මගින් පිළිතුරු ගෙන්වා ගැනීමේදී ඇතිවන ගැටළු මග හරවා ගැනීම සඳහා **Whatsapp** සහ **e-mail** භාවිතා කිරීමට උපදෙස් දෙන ලදී. | හැකි සෑම අවස්ථාවේම මසක් තුල පිළිතුරු ලබා ගැනීමට කටයුතු කරන අතර එසේ නොමැති අවස්ථාවලදී අතුරු පිළිතුරක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 07 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | ප්‍රදේශීය ලේකම් කාර්යාල මගින් පිළිතුරු ගෙන්වා ගැනීමේදී ඇතිවන ගැටළු මග හරවා ගැනීම සඳහා **Whatsapp** සහ **e-mail** භාවිතා කිරීම. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීමට නිලධාරීන් දැනුවත් කර ඇති අතර යම් හෙයකින් ඒ සඳහා මසකට වැඩි කාලයක් ගත වන්නේ නම් අතුරු පිළිතුරක් ගෙන්වා ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 08 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබිණි. | කොවිඩ් 19 ආපදා තත්වය පැවති සමයේදී යම් ප්‍රමාදයක් සිදු වුවද ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා නියමිත පරිදි භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලදී. | විගණකාධිපති වෙත ඉදිරිපත් කෙරේ. |
| 09 | වාහනයක් ගර්භිත වී මාස අටකට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම. | කළුතර කාර්මික විද්‍යාලයේ සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා පවරා දීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | ලියාපදිංචිය අහෝසි කර කාර්මික විද්‍යාලයේ සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා ලබා දීමේ අවසන් කටයුතු කෙරෙමින් පවතී. |
| 10 | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබිණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | PD-6178 හා PC 5367 දරණ වාහන සම්බන්ධයෙන් මු.රෙ අනුව කටයුතු අවසන් කර ඇත. MC 7749 දරන වාහනය සම්බන්ධව පරීක්ෂණය අතරතුර එහි අයිතිය වෙනත් අමාත්‍යාංශයකට පවතින බව තහවුරු වූ බැවින් මේ වනවිට එය පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| 11 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂා කර නොතිබීම. | කොවිඩ් 19 ආපදා තත්වය හේතුවෙන් 2020, 2021 වර්ෂයන්හිදී ද 2022 වර්ෂයේ ඇති වූ ඉන්ධන අර්බුදය හේතුවෙන් එම වර්ෂයේදීද වාහනවල ඉන්ධන දහනය වීම් පරීක්ෂණ සිදු කිරීමට බාධා එල්ල වුණි. | දැනට පරීක්ෂා කිරීම් සිදු කරනු ලබයි. |
| 12 | සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | වාහනයේ ඉදිරිපස රාජ්‍ය ලාංඡනය දක්වා ඇති අතර ඉදිරියේදී රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 13 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු. රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | මේ වන විට නිරවුල් කර ඇත. |
| 14 | වර්ෂයකට වඩා වැඩි කාලයක් සිට පැවත එන හිග ණය ශේෂ පැවතුණි. | නිරවුල් කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර වර්තමාන ප්‍රගතිය ඇමුණුම 01 මගින් දක්වා ඇත. |
| 15 | පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 | පොදු තැම්පත් ගිණුමේ තැන්පත් නිරවුල් කර ගැනීමට කටයුතු කරන ලෙස අදාල | බොහොමයක් තැන්පත් මේ වනවිට නිරවුල් කර ඇත. අග්‍රිම ප්‍රමාණවත් නොවීම මත කල් |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් දැනුවත් කර ඇත. | ඉකුත් වූ තැන්පත් ඉතිරි වී ඇත. |
| 16 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 10ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | දින 10ක් ඇතුලත අග්‍රිම නිරවුල් කලයුතු බවට නැවත නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව කටයුතු කරනු ලැබේ. |

<u>දෙවන කොටස : 71.00</u>

| | රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මග පෙන්වීම. | ගණන් දීමේ නිළධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|
| 17 | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම. | ඉදිරි වර්ෂ සඳහා නිසි පරිදි මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට අදාලව පියවර ගෙන ඇත. | 2023/2024 වර්ෂ සඳහා මානව සම්පත් සම්පත් සැලැස්ම සකස් කර ඇත. |
| 18 | සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | කාර්යය සාධන ගිවිසුම් නිකුත් කර ගිවිසුම්ගත වීමේ කටයුතු ආරම්භ කරන ලදී. | ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්ය සාධන ගිවිසුම් කටයුතු අවසන් කර ඇත. |
| 19 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය. හඳුනාගත් කාර්ය දර්ශකයේ ළගා වීම 24%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | 2021/2022 වර්ෂයේ පැවති කෝවිඩ් සහ ආර්ථික අර්බුද ය හේතුවෙන් කාර්ය දර්ශකයේ අරමුණ කරා ළගා වීමට අපොහොසත් වී ඇත. |
| 20 | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කර ඇත. |
| 21 | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝග නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | |
| 22 | සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | බහුතර මාණ්ඩලික නිලධාරීන් පිරිසක් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී ඇති අතර ඉතිරි නිලධාරීන්ද ලබා දෙමින් පවතී. |

..................................
දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කළුතර

..................................
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කළුතර



ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
කළුතර
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්

එල්.එම්. පතිරගේ
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කළුතර

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍ය සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

ඇමුණුම 01

**<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් විගණනය - 2023</u>**

| වර්ගය | නිලධාරියාගේ නම හා තනතුර | 2022.12.31 ශේෂය (රු.) | 2023.12.31 ශේෂය (රු.) | වත්මන් තත්වය |
|---|---|---|---|---|
| 1 මියගිය නිලධාරීන් | (i) ඩබ්. දයානන්ද<br>මුරකරු<br>බුලත්සිංහල ප්‍රා.ලේ. | 121,395.26 | 97,395.26 | 2024.04.09 දිනට ශේෂය - රු.84,895.00<br>2024 ජනවාරි මස සිට මාර්තු දක්වා රු. 3000.00 බැගින් ද අප්‍රේල් මස සිට 3500.00 බැගින් ද අය කෙරේ. |
| | (ii) එල්. අරුණ<br>ග්‍රාම නිලධාරී<br>බේරුවල ප්‍රා.ලේ. | 209,738.00 | 209,738.00 | මරණ පාරිතෝෂිකය ලැබුණු පසු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| 2 විශ්‍රාම ගිය නිලධාරීන් | (i) ආර්. පී. එම්.හේමලතා<br>ක.සේ.නි.<br>මදුරාවල ප්‍රා.ලේ. | - | 132,000.00 | 2024 අප්‍රේල් මස ගිණුම් සාරාංශය මඟින් නිරවුල් කර ඇත. |
| 3 වැඩ තහනම් කර ඇති නිලධාරී | (i) ඩී.ඒ.ජේ.පී. සිල්වා<br>ග්‍රාම නිලධාරී<br>කළුතර ප්‍රා.ලේ. | 202,030.00 | 200,030.00 | 2023.12.10 වන සිට සෑම මසකම 10 වන දින රු.2000/- බැගින් ගෙවා ගෙන යාමටත් නැවත සේවයේ පිහිටුවීමේදී හිඟ මුදල ගෙවීමටත් එකඟ විය. |
| 4 සේවය අතහැර ගිය නිලධාරීන් | (i) ටී.ඩී.යූ.වී.විජේරත්න<br>කළ.සේවානි<br>කළුතර ප්‍රා.ලේ. | 115,000.00 | 78,750.00 | හිඟ මුදල - රු.70,000.00<br>2023 සැප්තැම්බර් මස සිට රු.8,750.00 බැගින් මාසිකව ගෙවනු ලැබේ. |
| | (ii) එන්.ටී.පී.ජී. ඒ. නයනජිත්<br>කා.කා.ස.<br>කළුතර ප්‍රා.ලේ. | 78,363.41 | 58,203.41 | හිඟ මුදල - රු. 54,843.41<br>ඇප කරු වන ඒ.එස්. අමරතුංග ගෙන් මාසිකව රු. 1680 /- බැගින් අයකරනු ලැබේ. |